**බදුල්ල - වෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2020**

බදුල්ල - වෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) අනු ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වූ වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, පේරාදෙණිය-බදුල්ල-වෙන්කලාඩි මාර්ගය, බදුල්ල සිට වෙන්කලාඩි දක්වා කිලෝමීටර් 147 ක් ප්‍රතිසංස්කරණය කිරීමෙන් ඌව පළාත සහ මධ්‍යම පළාත සමඟ නැගෙනහිර පළාතේ සම්බන්ධතාව වැඩිදියුණු කිරීම මගින් කලාපයේ ප්‍රවාහනය වැඩිදියුණු කිරීම සහ කලාපයේ ආර්ථික කටයුතු වැඩිදියුණු කිරීමයි. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 18,200 කට සමාන එ.ජ.ඩො. මිලියන 140 ක් වූ අතර ඉන් රු. මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො. මිලියන 60ක් මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා OPEC අරමුදල සහ රු. මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො. මිලියන 60 ක් මූල්‍යායනය කිරීමට සංවර්ධනය සඳහා සෞදි අරමුදල විසින් එකඟ වී තිබුණි. ඉතිරි එ.ජ.ඩො. මිලියන 20 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ කටයුතු 2019 මාර්තු මාසය වන විට නිම කිරීමට නියමිතව පැවතුණි.

**1.3 තත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කළමනාකාරීත්වය විසින් වැඩසටහන ඇවර කිරීමට හෝ මෙහෙයුම් නැවැත්වීමට අදහස් කරන්නේ නම් මිස හෝ එසේ කිරීම හැර යථාර්තවාදී විකල්පයක් නොමැති විට අඛණ්ඩ පැවැත්ම ඉදිරියට පවත්වා ගැනීමට ව්‍යාපෘතියේ හැකියාව තක්සේරු කිරීම, අදාල වන පරිදි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධ කරුණු හෙළිදරව් කිරීම සහ ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම සංකල්පය භාවිතා කිරීම කළමනාකරණයේ වගකීමවේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳව විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරිමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 1,445.5 ක් වූ ව්‍යාපෘති වියදම්වලට අදාළව අනුමත අන්තර් ගෙවීම් සහතික 14 ක් ව්‍යාපෘතිය විසින් ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, කෙරීගෙන යන වැඩ සහ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ගිණුම් එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. තවද, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සහ ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල් ගිණුම පිළිවෙලින් රු. මිලියන 390.88 සහ රු.මිලියන 34.33 කින් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වේ. සඳහන් කර ඇති අන්තර් ගෙවීම් සහතික දැනටමත් 2021 වර්ෂයේ ගිණුම් වාර්තා වෙත ගෙන ඇත. | මූල්‍ය වර්ෂය සඳහා වූ සියලුම ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ප්‍රකාරව 2020 දෙසැම්බර් මාසය සඳහා අදාළ අන්තර් ගෙවීම් සහතික 05 ක් සඳහා රු.මිලියන 272.22 ක ප්‍රතිපාදන සපයා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කෙරීගෙන යන වැඩ, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු සහ ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල් පිළිවෙලින් රු. මිලියන 272.22, රු. මිලියන 174.75 සහ රු. මිලියන 2.68 කින් අඩුවෙන් දක්වා ඇති අතර, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු. මිලියන 94.78 කින් වැඩියෙන් දක්වා ඇත. | මූල්‍ය වර්ෂයෙන් පසුව සහ මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමෙන් පසු සඳහන් කර ඇති අන්තර් ගෙවීම් සහතික ව්‍යාපෘතියට ලැබී ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව ප්‍රතිපාදන සැපයිය යුතුය. |
| (ඇ) | 2020 නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා අධීක්ෂණ උපදේශන වියදම්වලට අදාළ අනුමත අන්තර් ගෙවීම් සහතික 04 ක් ව්‍යාපෘතිය විසින් ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කෙරීගෙන යන වැඩ සහ උපදේශකයින් වෙත ගෙවිය යුතු මුදල රු. මිලියන 24.92 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය වර්ෂයෙන් පසුව සහ මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමෙන් පසු සඳහන් කර ඇති අන්තර් ගෙවීම් සහතික ව්‍යාපෘතියට ලැබී ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව ප්‍රතිපාදන සැපයිය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතුවල භෞතික ප්‍රගතිය

| අංකය | සංරචකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම | OFID අංශයේ ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම යටතේ, සෑම කොන්ත්‍රාත්තුවක්ම දළ වශයෙන් කිලෝමීටර් 20 ක දිගක් ආවරණය කිරීමට සැලසුම් කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් පැකේජය 01, පැකේජය 02 සහ පැකේජය 03 සඳහා අදාළ වන භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 100 ක්, සියයට 77 ක් සහ සියයට 50 ක් ලෙස වාර්තා වී තිබුණි. | එකඟ වේ. | මාර්ගවල ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම | ගිවිසුමට අනුව අවසන් කිරීමට නියමිත කාලය වසර දෙක හමාරක් වුවද, OFID කොටසේ පැකේජය 03 සඳහා වන කොන්ත්‍රාත්තුව ඉදිකිරීම් කටයුතු ආරම්භ කර වසර 03 ක් සහ මාස 05 ක් ගතවී තිබියදීත් 2020 දෙසැම්බර් 31 දිනට සැලසුම් කර තිබූ සියයට 100 ක ප්‍රගතියට සාපේක්ෂව සියයට 50 ක ඉතා අඩු ප්‍රගතියක් වාර්තා කර තිබුණි. | 2021 ජුලි 12 වන දින තීරණයට අනුව, ප්‍රගති සමාලෝචන රැස්වීමේදී, කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් ස්ථානයේ වැඩ නතර කර ඇති අතර, පසුව වැඩ කඩිනම් කිරීම සඳහා පැකේජ දෙකකට වෙන් කර ඉතිරි වැඩ සඳහා ටෙන්ඩර් කැඳවීම සහ ප්‍රසම්පාදනය සිදු වෙමින් පවතී. | මාර්ගවල ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | OFID කොටසේ 03 වන පැකේජය සඳහා කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය නිවැරදි කිරීම සඳහා ඉංජිනේරුවරයා විසින් 2020 දෙසැම්බර් 07 දින "නිවැරදි කිරීමට දැන්වීම" නිකුත් කර තිබුණද, එම කටයුතු කඩිනම් කිරීමට සහ අවසන් කිරීමට ව්‍යාපෘතිය මඟින් කිසිදු සාර්ථක ප්‍රතිකර්ම ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2021 ජුලි 12 වන දින තීරණයට අනුව, ප්‍රගති සමාලෝචන රැස්වීමේදී, කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් ස්ථානයේ වැඩ නතර කර ඇති අතර, පසුව වැඩ කඩිනම් කිරීම සඳහා පැකේජ දෙකකට වෙන් කර ඉතිරි වැඩ සඳහා ටෙන්ඩර් කැඳවීම සහ ප්‍රසම්පාදනය සිදු වෙමින් පවතී. | ඉතිරි වැඩ කඩිනම් කර අවසන් කිරීමට සාර්ථක ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 වන දිනට, OFID කොටසේ පැකේජ 03 හි කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාණ බිල්පතෙහි ඇතුළත් බිම් වැඩ, උප පාදම්, පාදම් සහ උරහිස්, මතුපිට ඇතිරීම්, පාලම් සහ අනෙකුත් ව්‍යුහයන් සඳහා ලබා දී ඇති ප්‍රතිපාදනවලින් අඩක්වත් ප්‍රයෝජනයට ගෙන නොමැති බව නිරීක්ෂණය විය. එම කටයුතු සිදු කර ඇති කිලෝමීටර් දිග සැලකූ විට උරහිස් වැඩ සියයට 6.58 ක් ද, ABC සහ ප්‍රයිම් කෝට් සියයට 32.11 ක් ද, බැම්ම සියයට 40 ක් ද, තාර දැමීම සියයට 30.79 ක් ද පමණක් සිදු කර තිබුණි. | දැනට සිටින කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම අවසන් කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. | මාර්ගවල ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවල 14.6 උප වගන්තියට අනුව, අන්තර් ගෙවීම් සහතිකයේ සහතික කළ වැඩ වටිනාකම, කොන්ත්‍රාත්තුවේ වටිනාකමෙන් සියයට 2 කට වඩා වැඩි විය යුතුය. කෙසේ වෙතත්, අන්තර් | මෙම ගෙවීම් කොන්ත්‍රාත්කරුගේ මුදල් ප්‍රවාහ වැඩිදියුණු කිරීම සහ ව්‍යාපෘතියේ ප්‍රතිලාභය සඳහා සිදු කරන ලදී. | පිරිවැය, කාලය සහ කොන්ත්‍රාත්කරුවන් සඳහා වන අනවශ්‍ය අනුග්‍රහය අවම කර ගැනීම සඳහා කොන්ත්‍රාත් කොන්දේසියේ |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් සහතික අවශ්‍ය සීමාවට වඩා පහළින් ඇගයීමට ලක් වූ අවස්ථා 44 ක් නිරීක්ෂණය විය. | | නියම කර ඇති සීමාවන් පිළිපැදීම අවශ්‍ය වේ. |
| (ඇ) | ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල (OFID) සමඟ ඇති කර ගත් ණය ගිවිසුමට අනුව, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා මුදල් වෙන් කර නොතිබුණි. කෙසේ වෙතත්, ඉඩම් අත්පත් කර ගැනීම් හා ඒ ආශ්‍රිත කටයුතුවලට සම්බන්ධ විමර්ශන නිලධාරියෙකුට සහ පරීක්ෂණ නිලධාරියෙකුට උපදේශක වෙත කරන අන්තර් ගෙවීම් හරහා 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1.6 ක මුදලක් ගෙවා තිබුණි. එම තනතුරු 02 ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සේවක සංඛ්‍යාවට ඇතුළත් කර නොතිබූ අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා නිශ්චිත සේවක සංඛ්‍යාව හඳුනා නොගෙන ඉහත සඳහන් වියදම් දරා ඇති බව නිරීක්ෂණය විය. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් එක් විශ්‍රාමික ප්‍රාදේශීය ලේකම්වරයෙකු එම කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ කැමැත්ත සහ අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව පත් කරන ලදී. | අනාගත ව්‍යාපෘතිවලදී ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා නිශ්චිත සේවක සංඛ්‍යාව හඳුනා ගැනීම අවශ්‍ය වේ. |